# බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය

WESTERN PROVINCE TOURIST BOARD

**බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලයේ පහත තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## සංචාරක ප්‍රවර්ධන නිලධාරී II

සේවා ගණය : කණිෂ්ඨ කළමනාකාර

වැටුප් පරිමාණය : JM 1-1 (72,650 – 10 X 1,360 -18 X 2,040 – 122,970/-)
2026.01.01 දිනට හිමි රු. 65,633/- මූලික වැටුප මත පිහිටවනු ඇත.
මීට අමතරව අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

**සුදුසුකම් :**

- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් අලෙවිකරණය ව්‍යාපාර පරිපාලනය කළමනාකරණය වානිජ්‍යය හෝ සංචාරක යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම
- වයස සීමාව - අවු.22 ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක කාලසීමාවක් තුල බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය.

## සංවර්ධන නිලධාරී III

සේවා ගණය : ආශ්‍රිත නිලධාරි

වැටුප් පරිමාණය : MA 3 රු (53,940 – 10 X 800 -11 X 1190 - 10 X 1320 - 5 X 1350 – 94,980/-)
2026.01.01 දිනට හිමි රු. 49,831/- මූලික වැටුප මත පිහිටවනු ඇත.
මීට අමතරව අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

**සුදුසුකම් :**

- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම
- වයස සීමාව - අවු.22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක කාලසීමාවක් තුල බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය.

## කළමනාකරණ සහකාර III

සේවා ගණය : කළමනාකරණ සහකාර(තාක්ෂණික නොවන)

වැටුප් පරිමාණය : MA 1-1 රු (46,220 -10 X 540 -7 X 630 - 4 X 890- 5 X 495 – 20X 1,190 -83,390/-)
2026.01.01 දිනට හිමි රු. 43,312/- මූලික වැටුප මත පිහිටවනු ඇත.

**සුදුසුකම් :**

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ සහ ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම

සහ

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03) ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම

සහ

- පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය පිළිබඳ තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම
- වයස සීමාව - අවු.18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- අයඳුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක කාලසීමාවක් තුල බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය.

## රියදුරු III

සේවා ගණය : ප්‍රාථමික ශිල්පීය

වැටුප් පරිමාණය : PL 3 රු (43,280 -10 X 490 -10 X540 - 10 X 590 - 512X 630 -67,040/-)
2026.01.01 දිනට හිමි රු. 40,834/- මූලික වැටුප මත පිහිටවනු ඇත.

**සුදුසුකම් :**

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙන් සම්මාන දෙක(02) ක් සහිතව විෂයයන් හය(06) කින් සමත්වීම.
- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන(03) ක පළපුරුද්දක් ලබා තිබීම
- වයස සීමාව - අවු.18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.
- අයඳුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක කාලසීමාවක් තුල බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය.

# කාර්යාල කාර්ය සහායක III

සේවා ගණය : ප්‍රාථමික - ශිල්පීය නොවන
වැටුප් පරිමාණය : PL - 1 2025 රු (40,500 -10 X 450 -10 X 490 - 7X540 – 15 X 590 – 62,530/-)
2026.01.01 දිනට හිමි රු. 38,488/- මූලික වැටුප මත පිහිටවනු ඇත.

**සුදුසුකම් :**

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම
- වයස සීමාව - අවු.18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.
- අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක කාලසීමාවක් තුල බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය.

**<u>පොදු කරුණු</u>**

- පත්වීම් වල ස්වභාවය : ස්ථිර, සේවක ආර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත
- බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ.

**වෙනත්** : සෑම අයදුම්කරුවෙකුම ,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය .
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
IV. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක කාලසීමාවක් තුල බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය.

- ➢ බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලයේ නිල වෙබ් අඩවිය වන http://touristboard.wp.gov.lk/ වෙත පිවිස අදාල අයදුම්පත පත බාගත කරගත හැකි අතර, නිසි පරිදි සම්පූර්ණ කර අදාල අයදුම්පත සමග සුදුසුකම් දැක්වෙන සහතික වල පිටපත් ද සමඟ ලියාපදිංචි තැපෑලෙන් <u>2026.09.02 වන දින හෝ ඊට ප්‍රථම</u> **'' සභාපති, සංචාරක මණ්ඩලය (බස්නාහිර පළාත), 8 වන මහල, බස්නාහිර පළාත් සභා පරිශ්‍රය 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතුය. **ලිපි කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.** රාජ්‍ය ආයතනයන් හී අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානීන් මඟින් එවිය යුතුවේ.
- ➢ **සුදුසුකම් සපුරා නොමැති, නිසිලෙස සම්පූර්ණ කර නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ .**